105850
05-04-88

# ධම්මපදය හා භගවත් ගීතාව ඇසුරින් බෞද්ධ හා හින්දු ආචාර ධර්ම පිළිබඳ අධ්‍යයනයක්

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය වෙත ඉදිරිපත් කෙරෙණ
ශාස්ත්‍රපති බුද්ධධර්ම නිබන්ධය.

ලි.ප. අංකය: ඒ. 4012
විභාග අංකය: එස්.පී.ඒ.317

පාලි හා. බෞද්ධ අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.

105850

## පිළිගැන්වීම

මා මෙලොවට බිහි කොට ඇති දැඩි කළ පූජ්‍යනීයයන් වූ දෙමාපියන්ටත්, මා පැවිදි කොට අධ්‍යාපනය ලබා දුන් පූජ්‍යාචාර්යයන් වූ, මාතර කිතුලේවල ජයමහා විහාර විශ්වවිද්‍යාලය පරිවෙණාධිපතිව වැඩ සිටි, රාජකීය පණ්ඩිත අගලකඩ සද්ධම්ම කීර්ති ශ්‍රී ඥානේශ්වරාභිධාන නායක මාහිමියන්ට සහ සිරිකාමිගල්ලෙන රාජමහා විහාරාධිපති දිද්දෙණිපත සද්ධම්ම කීර්ති ශ්‍රී පේමරතනාභිධාන නායක මාහිමියන්ටත්, ගංගොඩවිල ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අංශ භාර ප්‍රධාන ආචාර්යයන් වන විත්‍රුම ගමගේ මැතිතුමා සහ උපදේශක කථිකාචාර්ය ආරියපාල පෙරේරා මැතිතුමාටත් මෙම කෘතිය භක්ත්‍යාදරයෙන් පිළිගන්වමි.

- සම්පාදක -

## ස්තූතිය

මෙබඳු ශාස්ත්‍රීයකට මා දිරි ගන්වා මග පෙන්වූ, ගංගොඩවිල ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අංශයේ කථිකාචාර්ය තුමන්ලාටත්, මේ සඳහා නන් අයුරින් උපදෙස් දෙමින් උපකාර කළ, උපදේශකාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආරියපාල පෙරේරා මැතිතුමාටත්, මෙහි පිටපත් කියවා ශෝධ-නය කළ, මාතර කිතුලේවල ජයමහා විහාර උපාධි පීඨයේ ආචාර්ය, පණ්ඩිත එම්. ජේ. සිරිවර්ධන මැතිතුමාටත් මාගේ ගෞරවාදර ස්තූතිය පිරි නමමි.

අගලබඩ පියසිරි හිමි.

# ඇතුල් පිටු


| | | |
|---|---|---|
| | | පිටු අංක |
| | සංක්ෂේප නිරූපනය :- | 1- iii |
| 1. | පරිච්ඡේදය :- | 1- 12 |
| | i. ආචාර ධර්ම අර්ථ කථනය | |
| | ii. ආචාර විද්‍යාවේ ස්වභාවය හා පරමාර්ථ | |
| | iii. සදාචාර නියමයෝ | |
| 2. | පරිච්ඡේදය | 13- 32 |
| | i. හින්දු ආචාර ධර්ම | |
| 3. | පරිච්ඡේදය | 33- 62 |
| | i. බෞද්ධ ආචාරධර්ම | |
| 4. | පරිච්ඡේදය | 63- 78 |
| | i. ධම්මපදයේ හා භගවත් ගීතාවේ ඓතිහාසික පසුබිම | |
| | i. ධම්මපදය | |
| | ii. භගවත් ගීතාව | |
| 5. | පරිච්ඡේදය | 79- 111 |
| | i. ධම්මපදයෙන් හා භගවත් ගීතාවෙන් හෙළිවන ආචාරධර්මයන්හි සම-විෂමතා | |
| | ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය | 112- 118 |

## සංකේත නිරූපණය

| | | |
|---|---|---|
| අ.අ.ම.වි. | – | අවශ්‍ය අධ්‍යාපන මනෝ විද්‍යාව |
| අත්. අ. | – | අත්ථසාලිනී අටුවාව |
| ආ. අන්. | – | ආචාර ධර්ම අන්වේෂණ |
| ආ. පර්ව. | – | ආදිපර්ව |
| ආ. පං. ප්‍ර. | – | ආචාර ධර්ම වාදයේ පංචවිධ ප්‍රභේද |
| අං. නි. | – | අංගුත්තර නිකාය |
| ඉ. ද. | – | ඉන්දිය දර්ශනය |
| ඉං. සිං. ශ. | – | ඉංග්‍රීසි – සිංහල ශබ්ද කෝෂය |
| උ. පා. | – | උදාන පාලි |
| කඨ. | – | කඨෝපනිෂද් |
| ඛු. නි. | – | ඛුද්දක නිකාය |
| ග්‍රී. ද. | – | ග්‍රීක දර්ශනය |
| ඡා. උ. | – | ඡාන්දෝග්‍ය උපනිෂදය |
| ජාත. | – | ජාතකට්ඨකථා |
| තෛත්. උ. | – | තෛත්තිරීය උපනිෂද් |
| ථේ. ගා. | – | ථේරගාථා |
| ද. කති. | – | දඹදෙණි කතිකාවත |
| දී. නි. | – | දීඝ නිකාය |
| ධ. ප. | – | ධම්මපදය |
| ධ. ගී. | – | ධම්මපද ගීත |
| ධ. වි. | – | ධම්මපද විවරණ |
| ධ. අ. ග. | – | ධම්පියා අටුවා ගැටපදය |
| ධ. සං. අ. | – | ධම්මසංගණි අටුවාව |
| නූ. බ. ද. | – | නූතන බටහිර දර්ශනය |
| පා. පා. | – | පාරාජිකා පාලි |

| | | |
|---|---|---|
| බු. ව. ධ. | - | බුදුන් වදාළ ධර්මය |
| බෘ. උ. | - | බෘහදාරණ්‍යක උපනිෂද් |
| බෞ. ආ. ධ. | - | බෞද්ධ ආචාර ධර්ම |
| බෞ. චි. ඉ. | - | බෞද්ධ චින්තාවේ ඉතිහාසය |
| භ. ගී. | - | භගවත් ගීතා |
| භා. ද. ඉ. | - | භාරතීය දර්ශන ඉතිහාසය |
| ම. නි. | - | මජ්ඣිම නිකාය |
| මනු. | - | මනුස්මෘතිය |
| මා පා. | - | මහාවග්ග පාලි |
| ම. වස් | - | මහා වස්තුව |
| මුඩ. | - | මුණ්ඩකෝපනිෂද් |
| මූ. මා. කා. | - | මූල මාධ්‍යමික කාරිකා |
| මෛ. උ. | - | මෛත්‍රී උපනිෂද් |
| ව. ධ. ශා. | - | වසිෂ්ඨ ධර්ම ශාස්ත්‍ර |
| වි. මා. | - | විශුද්ධි මාර්ගය |
| වෛ. සා. | - | වෛදික සාහිත්‍යය |
| ස. සා. | - | සද්ධර්ම සාගරය |
| අ.සා. සහ බ.ද.පො. | - | අභිනව කථාවත සහ බණ දහම් පොත |
| සං. නි. | - | සංයුත්ත නිකාය |
| සං. ඉ. ද. | - | සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය |
| සිං. වි. | - | සිංහල විශ්ව කෝෂය |
| ශ්‍රී. සු. ශ. | - | ශ්‍රී සුමංගල ශබ්ද කෝෂය |
| A.B.M.OF.P.E. | - | A Buddhist Manual of Psychological Ethics |
| A.H.OF.M.P. | - | A History of Modern Philosophy |
| A.Ma.OF.Et. | - | A Manual of Ethics |
| A.S.H.OF.Et. | - | A Short History of Ethics |
| D.C.N.R. | - | Dialagues Concetning Natural Religion |

ශ්‍රී ... විද්‍යාලය
පුස්තකාලය

| | | |
|---|---|---|
| E.B.T.OF.Kn | - | Early buddhist Theory of Knowledge |
| En.Br. | - | Encyclopaedia Britannica |
| En.Of.Bu. | - | Encyclopaedia of Buddhism |
| E.Of.R.and Et. | - | Encyclopaedia of Religion and Ethics |
| Et.... 5. | - | Ethics Part, 5 |
| Fu. of. Et. | - | Fundamental Principles of The Metaphysis of Morals |
| In.Ph. | - | Indian Philosophy |
| K.E.of.P.R. | - | Kants Eritique of Practical Reason |
| Kn. and Co. | - | Knowledge and Conduct |
| Pr. Et. | - | Principia Ethica |
| R.OF.Ch. | - | Religion of Chinese |
| R.OF.Hi. | - | Religion of Hindus |
| RV. | - | Rigveda |
| S.P.Br. | - | Satha patha Brahmana |
| The E.OF.Bu | - | The Ethics of Buddhism |
| The H.OF.Hi. | - | The Heart of Hindusthan |
| The N.En.Br. | - | The New Encyclopaedia Britannica |
| The Ph.OF.D.H. | - | The Philosophy of David Hume |
| T.OF.H.Un. | - | Treatise of Human Understanding |

ධම්මපදය හා භගවත් ගීතාව ඇසුරින් බෞද්ධ හා

හින්දු ආචාර ධර්ම පිළිබඳ අධ්‍යයනයක්

# 1 - පරිච්ඡේදය

## ආචාර ධර්මය අර්ථ කථනය

"ආචාර" යන්නෙන් හැසිරීම, යහපත් හැසිරීම, ක්‍රියා කිරීම, චාරිත්‍රය, පුරුද්ද යන අර්ථ කිහිපයක් ගම්‍යමාන වේ.[1] ඉංග්‍රීසි භාෂාවේ "ආචාර ධර්ම" යන්නට ETHICS යන වචනය භාවිත වේ.[2] ග්‍රීක් භාෂාවේ චරිතය, හැසිරීම යන අර්ථ සඳහා ETHOS, ETHICOS යන වචන භාවිත වන අතර, ඉංග්‍රීසි භාෂාවේ ETHICS යන වචනයද ග්‍රීක් භාෂාවේ යන වචනයෙන් බිඳී ආවක් බව පෙනේ.[3]

මේ අනුව ETHICS යන වචනය ද ග්‍රීක් භාෂාවේ මෙන් චරිතය, හැසිරීම, පුරුද්ද යන අර්ථ සඳහා යෙදෙන බැවින්, ආචාර ධර්මය මිනිසාගේ පුරුදු, සිරිත් විරිත් හෙවත් චරිත විග්‍රහ කරමින් ඒවායේ යහපත - අයහපත හෝ හොඳ - නරක සලකා බලන බැව් පැහැදිලි වේ. මේ අනුව "ආචාර විද්‍යාවෙන් කරනු ලබන්නේ මිනිසාගේ චරිත විග්‍රහයකි."[4] යන මතය පිළිගත හැකිය.

## ආචාර විද්‍යාවේ ස්වභාවය හා පරමාර්ථ

ආචාර ධර්මයෙන් අදහස් කරනු ලබන්නේ, මිනිසුන්ගේ ක්‍රියාවන් විස්තර කිරීමේදී, හොඳය - නරකය, හරිය - වැරදිය යන වචන ව්‍යවහාර

---

1. ශ්‍රී.සු.ශ. 117 පිට.
2. ඉං.සිං.ශ. 316 පිට.
3. The N.En.Br. Vol. 6, p. 977
4. Fu. of. Et. Cha. 1, P.4.

කරන්නේ කුමන අදහසකින්දැ යි විචාරාත්මකව පරීක්‍ෂා කිරීමකි.[5] මිනිසුන්ගේ ක්‍රියාවල හරි හෝ වරද හා ඒවායින් ඇතිවිය හැකි යහපත හෝ අයහපත සලකා බැලීම ආචාර ධර්මයෙන් කෙරෙන කාර්‍යය බව ශ්‍රේෂ්ඨ චින්තකයෙකු වූ ජෝන් එස්. මැකැන්සි අදහස් කරයි.[6] එමෙන්ම ආචාර ධර්මය චාකි හැසිරීමේ අවශ්‍ය පරමාදර්ශය හෝ යුක්තිය හා අයුක්තිය හෝ යහපත හා අයහපත හෝ පිළිබඳ කෙරෙන සිද්ධාන්තමය අධ්‍යයනයක් ලෙස ද ඔහු පෙන්වා දෙයි.[7]

පුද්ගලයා නිවැරදිව ක්‍රියා කරන්නේ කෙසේද, ඔහු කරන කවර ක්‍රියා හරිද - වැරදිද ආදි වශයෙන් හොඳ හා නරක, හරි හා වැරදි සලකා බැලීම ආචාර විද්‍යාවෙන් කෙරෙන බව මාර්ෂල් අර්බන් දක්වයි.[8] ආචාර ධර්මයට විද්‍යාත්මක ස්වරූපයක් ආරෝපණය වීමට ද මේ හොඳ - නරක පිළිබඳ විමර්ශනය නිසා විශේෂ නම්‍යතාවක් ඇති බව ද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරයි.[9]

හොඳ හා නරක පිළිබඳව කෙරෙන විමර්ශනයේදී ආචාර ධර්ම පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු බව මහාචාර්ය බ්‍රෝඩ් ප්‍රකාශ කරයි.[10] එසේම ජී.ඊ.මුවර්, මිනිස් චරිතයේ හොඳ හා නරක විනිශ්චය කිරීම ආචාර ධර්මයෙන්

---

5. සිං.වි. 422 පිට.
6. A.Ma.of.Et P.3
7. ආ. අ. 3 පිට.
8. Fu. of Et., Cha. 1, P4
9. Ibid, P 6
10. ආ.සං.ග්. 7 පරි - 197 පිට.

කරනු ලබයි. යන මතය ප්‍රතික්ෂේප කොට මිනිස් චරිතයේ යහපත හා අයහපත කොට ප්‍රධාන වශයෙන් යහපත යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද යන්න පිළිබඳව පමණක් ආචාර ධර්මයෙන් විමර්ශනය කෙරෙන බව දක්වයි.[11]

ආචාර ධර්ම යන්න මානුෂික චරියාවන් පදනම් කර ගෙන ගොඩ නැගී ඇති සියළුම ක්‍රියාවන් හැඳින්වීම සඳහා භාවිත වන වචනයක් බව දක්වන එච්.එච්.විලියම්ස්, සමාජයෙන් සමාජයට, යුගයෙන් යුගයට එය වෙනස් වන බවත්, මානව චරියාවේ ඓතිහාසික පරිණාමය විමර්ශනය කිරීම අතින් ද ආචාර ධර්ම විශේෂ වැදගත් කමක් උසුලන බවත්, සඳහන් කරයි.[12]

ඉහත දැක්වූ ආචාර විද්‍යාඥයින්ගේ මත වලට සමාන විග්‍රහයක් දක්වන මහාචාර්ය මුරිහෙඩ්, අපට විද්‍යාවන් දෙවර්ගයක් ඇති බවත්, (එනම්: යම් යම් දෙයෙහි යථා ස්වභාවය පරිදි ඒ සම්බන්ධ විස්තරයන්ගෙන් යුතු විද්‍යා සහ යම් යම් දේ පිළිබඳව අපගේ විනිශ්චයන්ගෙන් යුතු විද්‍යා වශයෙනි) ඉන් පළමු කොටස ස්වභාවික විද්‍යා යනුවෙනුත්, දෙවැනි කොටස ප්‍රමාණ බද්ධ හෙවත් විවේචනාත්මක විද්‍යා යනුවෙනුත් හැඳින්විය හැකි බව දක්වයි.[13] මේ අනුව මිනිස් චරිතය හා හැසිරීම පිළිබඳ විග්‍රහ වන ආචාර ධර්ම විවේචනාත්මක විද්‍යාවක් ලෙස හැඳින්විය හැකි බව පෙනේ.

---

11. Pr. At., Cha.1, P.2
12. En. Br., Vol. 9, P809
13. E. of R. and Et., Vol. 5, P.414

ආචාර විද්‍යාව පිළිබඳ වඩාත් ඵලදායී අධ්‍යයනය වන්නේ, දේශ, කාල වශයෙන් විශේෂයක් නැතිව, මිනිසුන්ගේ ක්‍රියා විනිශ්චය කිරීමේ ප්‍රධාන මිනුම් දණ්ඩ වන හැසිරීම පිළිබඳ සාර්වකාලීන පරමාදර්ශය කුමක්දැයි සෙවීමයි.[14] එහෙත් මෙම අදහසට විරුද්ධ වන වර්තමාන ආචාර ධර්ම විද්‍යාඥයෝ, සදාචාර සංකල්පයන් විශ්ලේෂණය කොට පැහැදිලි කිරීමත්, ඒ නයින් ජීවිතයේ ගැබ්ව පවතින කල්පනා එළිදරව් කිරීමත් මිස වැඩදායී වෙනත් වැඩක් ආචාර ධර්ම මගින් කළ නො හැකි යයි ද, ඇරිස්ටෝටල් පවා එට වැඩි යමක් නො කළේ යයි ද, ඒ නිසා පරමාදර්ශයන් සෙවීම නිෂ්ඵල දෙයක් යයි ද, ප්‍රකාශ කරති.[15]

ඉහත සඳහන් විග්‍රහයන් අනුව යම් පුද්ගලයෙකුගේ හැසිරීම, චරිතය හොඳ - නරක වශයෙන් නිර්ණය කරන සිද්ධාන්ත ගැන සොයා බැලීම ආචාර විද්‍යා-වේදී ඉටු වන කාර්යය බව පෙනේ. ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව ආදි විද්‍යාවන් මගින් විශ්වයේ පවතින ස්වාභාවික ක්‍රියාවලින් විග්‍රහ කෙරෙන අතර, ආචාර විද්‍යාව මිනිසාගේ ප්‍රතිපත්ති, සිරිත් විරිත්, ගුණ ධර්ම විග්‍රහ කරන බැව් වටහා ගත හැකියි.

ආචාර විද්‍යාව ප්‍රමාණිත අධ්‍යයනයක් ලෙස දක්වන මැකැන්සි, එය අන්තයක් සමග හෝ සම්මතියක් සමග හෝ පරමාදර්ශයක් සමග සම්බන්ධ වන නිසා, අනෙක් විද්‍යාවන් සියල්ලන්ගෙන් ම වෙන් කළ හැකි දෙයක් බව පෙන්වයි.[16] ආචාර විද්‍යාවෙන් ක්‍රියාව පිළිබඳ විස්තර වන නිසා, ඇතැම් විට එය ප්‍රායෝගික විද්‍යාවක් ලෙස සැලකිය හැකි වුවත් එසේ සැලකීම මුලාවක් ලෙස දක්වන ඔහු, ප්‍රායෝගික වශයෙන් දක්විය හැකි වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු විද්‍යා වැනි ඇතැම් විද්‍යාත්මක

---

14. ආ. අ්. 4 පිට.

15. සිං. වි. 422 පිට.

16. A. Ma. of. Et,. P.4

අධ්‍යයනයන් ඇතත් එවැනි අධ්‍යයනවලින් බලාපොරොත්තු වනුයේ ස්ථිර ප්‍රතිඵලයන් ලබා ගැනීම බවත්, ආචාර විද්‍යාවෙන් එබන්දක් බලාපොරොත්තු නොවන බවත්, පවසයි.[17]

ඉහත සඳහන් මතය අනුමත කරන මහාචාර්ය වොල්ෆ්, ආචාර ධර්මය ප්‍රමාණබද්ධ NORMATIVE විද්‍යාවක් මිස අස්තයාත්මක POSITIVE විද්‍යාවක් නො වන බවත්, එනිසා එය ප්‍රාථමික වශයෙන් මිනිසාගේ තථ්‍ය හැසිරීම හා සම්බන්ධ නො වන බවත් පරමාදර්ශීය හැසිරීම හා සම්බන්ධ වන බවත් දක්වයි.[18]

"ආචාර විද්‍යාව ප්‍රායෝගික විද්‍යාවක් නො වේය" යන අදහස අනුමත කරන මහාචාර්ය මුරිහෙඩ් ද, ආචාර විද්‍යාවෙන් එහි පරමාර්ථ විග්‍රහ කරනු විනා, එම පරමාර්ථ අත්පත් කර ගන්නේ කෙසේදැයි නීති පද්ධතියක් මගින් විස්තර නො කරන බැවින් එය ප්‍රායෝගික විද්‍යාවක් වශයෙන් නො සැලකිය යුතු බව දක්වයි.[19] මේ අතර ඇතැම් බටහිර විද්‍යාඥයෝ, ආචාර ධර්මය දාර්ශනික විමර්ශනයක් මිස විද්‍යාත්මක විමර්ශනයක් නො වේ යයි ද, නියම ආචාර ධර්මයේ කාර්යය වනුයේ, පරමාදර්ශවත් හැසිරීම මිස, තථ්‍ය හැසිරීම විමර්ශනය කොට විස්තර කිරීම නො වේ යයි ද අදහස් කරති.[20] එහෙත් එවැනි පරමාදර්ශයන් සොයා යාම නිසරු දෙයක් බව ද, අත්‍යෝමතික කල්පනා මාත්‍රයක් පමණක් බව ද, ජෙරමි, බෙන්තම් ආදි දාර්ශනිකයෝ පෙන්වා දෙති.[21]

---

17. Ibid, P.6
18. En. Br. ed. 1951, article of Ethics. by Abrahon Wolf, Vol. 8. P737
19. E. of. R. and Et. Vol.5, P414.
20. En. Pr., Vol.6, P976
21. සිං. වි. 423 පිට.

ආචාර ධර්මය විද්‍යාවක් වශයෙන් ගත්විට ඊට අයත් වන විශේෂ විෂයයන් ඇති බව දක්වන මහාචාර්ය වොල්ෆ්, හරි - වැරදි, වගකීම හා ආවේග අධ්‍යයනය කිරීම ආචාර ධර්මයට අයත් කාර්යයන් බව දක්වයි.[22] එමෙන්ම එයින් ඇතිවන විවිධ ගැටළු හා ප්‍රශ්න විසඳීම හෝ විස්තර කිරීමත්, සාවද්‍යතාව හෝ නිරවද්‍යතාව යනු කුමක්දැ යි විසඳීමත්, යම් ක්‍රියාවක් හරි හෝ වැරදි යයි නිශ්චය කිරීමට තුඩු දෙන යහපත් ධර්මතාවන් මොනවාදැ යි විමර්ශනය කිරීමත්, ආචාර ධර්මයෙන් සිදු විය යුතු බව ඔහු පෙන්වා දෙයි.[23]

ඉහත සඳහන් විග්‍රහයන් අනුව, ආචාර විද්‍යාවේ ප්‍රධාන පරමාර්ථය නම් ජීවිතයේ ශ්‍රේෂ්ඨත්වය කුමක්දැයි විමසා, එය විග්‍රහ කිරීමත්, එම ශ්‍රේෂ්ඨත්වය ලබා ගත යුතු ආකාරය පැහැදිලි කිරීමත්, ඒ සඳහා අනුගමනය කළ යුතු ධර්මතාවන් මොනවාදැ යි විස්තර කිරීමත් බව පෙනේ. එම ශ්‍රේෂ්ඨත්වය කරා ලඟා වීමට නම් මිනිසාගේ හොඳ නරක විනිශ්චය කළ හැකි පරම යහපත කුමක්දැ යි විසඳා ගත යුතුය. ඒ සඳහා පරම යහපත කුමක්දැ යි විග්‍රහ කරමින් බටහිර ආචාර විද්‍යාඥයින් දක්වා ඇති අදහස් විමසා බැලීම ප්‍රයෝජනවත් වේ.

පරම යහපත ලෙස සොක්‍රටීස් දැක්වූයේ, ඥානය හා බැඳි පවත්නා සතුටය යි. එබඳු සතුට දෙයාක් දක්වන ඔහු, දෛනික ජීවිතයේදී හමුවන සතුට ජන සම්මත සාධාත්වය ලෙසත්, සත්‍ය සතුට දාර්ශනික සතුට ලෙසත්, හඳුන්වයි. ඥානය අපරෝක්ෂිය බවත්, එය ප්‍රධාන කොට සද්ගුණයක් ගොඩ නැගිය නො හැකි බවත්, සොක්‍රටීස් දක්වයි.[24]

---

22. En. Br., Ed. 1951, Article of Ethics, by Abrahon Wolf, Vol.8, P737.
23. Ibid - P.737.
24. ත්‍රි.බ.ද.10පරි. - 124 පිට.

මිනිස් ජීවිතයේ පරමාදර්ශය සතුටය ලෙස දක්වන ප්ලේටෝ, REPUBLIC ග්‍රන්ථයේදි සෑම ව්‍යායාමයක ම අවසානය යහපත බවත්, සෑම සඳවනක ම බලාපොරොත්තුව යහපත බවත්, එම යහපත දිව්‍යමය බැවින් ඒ ගැන යමක් පැවසීම ඉතාමත් දුෂ්කර කරුණක් බවත් සඳහන් කරයි.[25] ප්ලේටෝ දක්වන මෙම සතුටය ලැබිය යුත්තේ ලෝකෝත්තර තත්වයකදිය. සාමාන්‍ය මිනිසාට එය ලැබිය නො හැක. සතුටය පිළිබඳ ඥානය, විශේෂ ආගමික පුහුණුවකින් ලබා ගත යුත්තක් හෙවත් වයසින් යුතු ගුරුවරුන් අත ඇති දීර්ඝ ප්‍රඥාමය විනයකින් ලබා ගත යුත්තක් බව පෙනේ.[26]

ඇරිස්ටෝටල් ද පරමාදර්ශය ලෙස දක්වා ඇත්තේ සතුටය බව, METAPHYSICS; DE ANIMA; NICOMACHEAN. ETHICS; MAGNA MORALIYA; යන ඔහුගේ කෘති වලින් පැහැදිලි වේ.[27] සුඛය හා සොම්නස එකක් ලෙස නො ගන්නා ප්ලේටෝ සහ ඇරිස්ටෝටල්, සුඛය යන්නෙන් දක්වන්නේ මිනිසාගේ විශිෂ්ටවූ ලක්ෂණය වන විචාර බුද්ධියට අනුකූල වූ පැවැත්මයි. එම සුඛය ලැබිය හැක්කේ [illegible] යහපත කෙවි රාජ්‍යයේ වෙසෙන පුද්ගලයාගේ යහපත බවත් දක්වයි.[28] මෙසේ මිනිසුන් සදාචාරවත් කිරීම පුරුද්දටත්, පුරුද්ද නීතියටත්, නීතිය ව්‍යවස්ථා දායකත්ව-යටත්, ව්‍යවස්ථාදායකත්වය දේශපාලනයටත් සම්බන්ධ කරමින් ආචාර ධර්මයේ යහපත දේශපාලනයට සම්බන්ධ කොට ඇති බව පෙනී වේ.[29]

මීට ප්‍රතිවිරුද්ධ අදහසක් ඉදිරිපත් කරන එපිකියුරීන් වාදීහු, සොම්නස ම සුඛය වශයෙන් සලකා ඥානවන්ත මිනිසාගේ යුතුකම, ස්වභාවය අනුව ජීවිතය ගෙව

---

25. සු.බ.ද - 150 පිට.

26. A.S.H.of.Et., P.55

27. En. Br., 1973 ed. 6, P.512, article ETHICS.

28. En. Br. Ed.1926, Vol.2, P512

29. En.Br. 1926 ed. Vol,9,P.512 article: Aristotce

ගවේෂා ගැනීම බවත්, එයින් අවසාන අරමුණ වන සතුට ලැබෙන බවත් පවසති.[30] ඔවුන් සතුට ලෙස සලකන්නේ, ශරීරය හා සම්බන්ධ නොවී සලකන විට වේදනාව නැති බවයි. එම සතුට නො නවත්වා මත්පැන් පානය කිරීමෙන් හෝ උද්යෝග-යෙන් ක්‍රීඩා කිරීමෙන් හෝ කාම රස විඳීමෙන් හෝ හොඳ ආහාර පාන ගැනීමෙන් ලැබිය නො හැකි බව ද දක්වයි.[31]

ටෝල්ස්ටෝයි වැනි අය දක්වන්නේ, තම සැපත නොව අනුන්ගේ සැපත පරමාදර්ශය වශයෙන් සලකන පරාර්ථකාමී සුඛ පරම වාදය යි.[32]

ආචාර ධර්මය හැසිරීමේ කලාවක් මුවත්, එයින් යටත් පිරිසෙයින් හැසිරීම පිළිබඳ කලාවක මග පෙන්වන හෙවත් මූල ධර්ම සපයන දෙයක් බව පවසන මැකැන්සි, සද්ගුණය ඇත්තේ ක්‍රියා කාරිත්වයේ බවත්, සද්ගුණයේ සාරය අධිෂ්ඨානය මත රඳා පවතින බවත් පෙන්වා දෙයි.[33] මීට අමතරව මිනිසාගේ හොඳ හෝ අගය, ඔහුගේ ක්‍රියාවන්හි පරිපූර්ණත්වය උඩ රඳී ඇතැයි පවසන අය සාරප්‍රාප්ති වාදය නමින් මිනිස් පරමාදර්ශයක් ඉදිරිපත් කරති.[34]

ඉහත සඳහන් පරිදි පරම යහපත කුමක්දැයි විවිධ පරමාදර්ශයන් ඉදිරිපත් වීමෙන් පසු ඒවා සාක්ෂාත් කර ගන්නේ කුමන මාර්ගයකින්දැයි පෙන්වීමට ද ආචාර ධර්මඥයින්ට සිදු විය. මේ ගැන ද සංකීර්ණ මත ඉදිරිපත් වී ඇතත්, ඒ අතර ප්‍රධාන මත තුනක් දැක්විය හැකියි:

---

30. Ibid, P513.

31. ශ්‍රී. ද. 218 පිට.

32. ආ.පං.ප්‍ර. 8 පරි. - 209 පිට.

33. ආ.අත්. 8-11 පිටු.

34. සිං.වි. 424 පිට.